*සැ. යු.–* 2007.08.31 දින පළ කරන ලද අංක 1,513 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,514 - 2007 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා - 2007.09.07**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ජේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 804 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 809 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... .. | — |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 809 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 සැප්තැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අගෝස්තු මස 31 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 331

DRF/21/RECT/2444.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 පෙබරවාරි මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

මේජර් ජෙනරල් නන්ද මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී (නි/50774)

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 පෙබරවාරි මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් නන්ද මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී (නි/50774)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-93

---

2007 අංක 332

DRF/21/RECT/2445.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිළ ස්ථිර කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජනවාරි මස 14 වන දින සිට ලුතිනන් කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) සමන් කපිල පරගොඩ ලියනගේ, ආර්එස්පී පීඑස්සී ශ්‍රීලංඉ (නි/60359

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජනවාරි මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් සමන් කපිල පරගොඩ ලියනගේ, ආර්එස්පී පීඑස්සී ශ්‍රීලංඉ (නි/60359)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-81

---

2007 අංක 333

DRF/21/RECT/2442.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

### විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 07 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

මේජර් සකිලි ආරච්චිගේ රෝහිත විජේපාල කරෙ (නි/60584)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-92

2007 අංක 334

DRF/21/RECT/2440.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 11 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතාන් (තාවකාලික මේජර්) නිසංක සමිත් තොටවත්ත ආර්එස්පී ගරෙ (නි/62131)

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 12 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් නිසංක සමිත් තොටවත්ත ආර්එස්පී ගරෙ (නි/62131)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

09-85

---

2007 අංක 335

DRF/21/RECT/2447.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 28 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතාන් (තාවකාලික මේජර්) සිංගන්කුට්ටි ආරච්චිලාගේ යසන්ත කුමාර ජයතිලක, ආර්එස්පී, ශ්‍රීලපාහ (නි/62031)

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 29 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සිංගන්කුට්ටි ආරච්චිලාගේ යසන්ත කුමාර ජයතිලක, ආර්එස්පී, ශ්‍රීලපාහ (නි/62031)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-84

---

2007 අංක 336

DRF/21/RECT/2458.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරි 2007 ජනවාරි මස 02 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

මේජර් දේව තන්තිරිගේ තුසිත දම්සිරි පියරත්න ශ්‍රීලකාහ (නි/60917)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-91

2007 අංක 337

DRF/21/RECT/2465.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිළ ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 04 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතන් (තාවකාලික මේජර්) ඉඳුරුවගේ රුවන් රංගනාත් ඩයස් ගැහේබ (නි/60833)

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 05 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ඉඳුරුවගේ රුවන් රංගනාත් ඩයස් ගැහේබ (නි/60833)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-82

---

2007 අංක 338

DRF/21/RECT/2460.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිළ ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිළ ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 19 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතන් (තාවකාලික මේජර්) හේවාතන්ත්‍රිගේ ජස්ටින් පීරිස්, ගැහේබ (නි/63100)

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 20 වන දින සිට ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

මේජර් හේවාතන්ත්‍රීගේ ජස්ටින් පීරිස්, ගැහේබ (නි/63100)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

09-83

---

2007 අංක 339

DRF/21/RECT/2265.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

1. කපිතන් පූනම් ක්‍රිස්තෝම්බුගේ ලාල් ප්‍රේමනාත් ද සිල්වා ආර්එස්පී ශ්‍රීලකාහ (නි/63796) - 2005 මාර්තු 08
2. කපිතන් (උපකරණ පාලක) දිහිටියාවල ගෙදර ගුණසිංහ යූඑස්පී ශ්‍රීලසසබ (නි/63113) - 2006 ජනවාරි මස 20
3. කපිතන් (උපකරණ පාලක) අතපත්තුවේ ඒකනායක මුදියන්සේලාගේ විජේරත්න බණ්ඩා ශ්‍රීලයුයුබ (නි/61578) - 2003 අප්‍රේල් මස 19
4. කපිතන් ගලතර ලේකම්ලාගේ අශෝක පියදස්සි බණ්ඩාර ශ්‍රීලයුවෙබ (නි/62267) - 2002 මාර්තු මස 13
5. කපිතන් (උපකරණ පාලක) කරුණාපේඩි ගෙදර ජයතිලක ශ්‍රීලංඉ - (නි/62646) - 2003 මාර්තු මස 01
6. කපිතන් (උපකරණ පාලක) චූඩාමානිගේ තිස්ස රංජිත් පෙරේරා ශ්‍රීලසසබ (නි/63757) - 2005 සැප්තැම්බර් මස 01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ දී ය.

09-94

2007 අංක 340

DRF/21/RECT/2448.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 29 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතාන් දියුණුගල්ගේ දේශ ශ්‍රී විජේරත්න ශ්‍රීලංසංඛ (නි/62282)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-86

---

DRF/21/RECT/2441.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැනීමක්

#### නිල පහත හෙළීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 02 වන දින සිට කපිතාන් නිළයට පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතාන් (තාවකාලික මේජර්) රුවන් දමින්ද රණතුංග, ශ්‍රීලකාහ (නි/63012)

#### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් රුවන් දමින්ද රණතුංග, ශ්‍රීලකාහ (නි/63012)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

09-95

---

2007 අංක 341

DRF/21/RECT/2462.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතාන් වීරසිංහගේ සුදත් රෝහන වීරසිංහ සබුබ (නි/64173)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-87

---

2007 අංක 342

DRF/21/RECT/2446.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 27 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

කපිතන් වික්‍රමසිංහ මුදියන්සේලාගේ ධම්මික බණ්ඩාර අබේකෝන් ශ්‍රීලංසිරෙ (නි/63361)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

09-89

---

2007 අංක 343

DRF/21/RECT/2111.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2005 ජනවාරි මස 30 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

නි/62408 ලුතිනන් (උපකරණපාලක) දාගිරි ලාල් කිත්සිරි ද සොයිසා ශ්‍රීලංසිරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

09 – 88

---

2007 අංක 344

DRF/21/RECT/2450.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 සැප්තැම්බර් මස 29 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

ලුතිනන් අත්තනායක මුදියන්සෙලාගේ ජනක අත්තනායක ආර්එස්පී ගැහේබ (නි/63586)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-90

---

2007 අංක 345

DRF/21/RECT/2461.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි 2007 ජනවාරි මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් සියසිංහ මුදියන්සේලාගේ අකිල ජානක ප්‍රියන්ත සියසිංහ, ශ්‍රීලංඉ (නි/64393)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-69

DRF/21/RECT/2381

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපතිතුමා උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 15 වන දින සිට අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

නි/65183 2/ලුතිනන් හේරත් මුදියන්සේලාගේ සුදේස් මංජුල හේරත් විපාරෙ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

09-96

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 346

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න මහතා 2006 ජුනි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වශයෙන්.

09-170

2007 අංක 347

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, බී. ඩී. දහනායක මහතා 2006 අගෝස්තු මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

09-68

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රුහුණ සංවර්ධන බැංකුව - මාතර නගර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාවයි.

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති *විශේෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2006.09.26 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද, 2005.05.09 දිනැති අංක 3985 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාතර, තුඩාව, 'රංග' නිවස පදිංචි තල්පාවිල කංකානම්ගේ නිහාල් සහ අංක 38, ඉසදින් නගරය, මාතර පදිංචි තල්පාවිල කංකානම්ගේ මාලනී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහසක (රු. 375,000) මුදලක් සහ රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2005.07.05 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් තුන්ලක්ෂ හැත්තෑපන්දහසක (රු. 375,000)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3985 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ තුඩාවේ පිහිටි කොම්පඤ්ඤවත්ත හෙවත්, තුඩාවෙහේන කියන ඉඩමේ 'බී' සහ 'සී' අක්ෂර දරන ඒකාබද්ධ කැබලිවලින් බෙදා වෙන්කළ අංක 12 දරන කැබැල්ල, උතුරට : එම ඉඩමේ 'ඒ' අක්ෂරය දරන කැබැල්ල ද, නැගෙනහිරට : එම ඉඩමේ අංක 13 දරන කැබැල්ල ද, දකුණට : එම ඉඩමේ පාරක් සඳහා වෙන්කළ අංක 20 දරන බිම් තීරය ද, බස්නාහිරට : එම ඉඩමේ අංක 11 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) ක් විශාල ඉඩමත් ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියලුම දේ සම්පූර්ණයෙන් ද වේ.

මෙම ඉඩම ඒ 416/113 යටතේ 2005.05.09 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ජී. විමලරත්න
සාමාන්‍යාධිකාරී,

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන.

09-107

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230000720.

ණයකරුගේ සම්පූර්ණ නම : සවලප්පුගේ ජෝසප් ජයන්ත ප්‍රනාන්දු සහ ලින්දර මුදියන්සේලාගේ ප්‍රියංගනී මංගලිකා.

බුත්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එන්. පී. විතාන විසින් ලියා සහතික කරන ලද අංක 2683 හා 1999.08.05 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හතලිස්දහස් දෙසීය හතරයි ශත හැත්තෑ අටක (රු. 1,40,204.78) ක මුදලක් වර්ෂ 2005.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දහනවදහස් පන්සිය විසිඅටයි ශත පනස්පහක (රු. 1,19,528.55) ද වර්ෂ 2005.09.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිදහස් හයසිය හැත්තෑ හයයි ශත විසිතුනක් (රු. 20,676.23) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස්දහස් දෙසීය හතරයි ශත හැත්තෑ අටක (රු. 1,40,204.78) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දහනවදහස් පන්සිය විසිඅටයි ශත පනස්පහක (රු. 1,19,528.55) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.5% බැගින් වන පොළියක් 2005.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ක් වූ ජනවාරි මස 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කොටුගොඩ ග්‍රාමයේ පිහිටි මාරගහවත්ත සහ ගොරකගහවත්ත නැමැති ඉඩමට 1998.07.30 දින එස්. එම්. දිසානායක මානක තැන විසින් මැන සම්පාදිත අංක 6313 පිඹුර ප්‍රකාර ලොට් 22 ට මායිම්, උතුරට : කැබලි අංක 20 ද, නැගෙනහිරට : පාර (ප්‍රාදේශීය සභා) ද, දකුණට : රොබට් ප්‍රනාන්දුගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් 21 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B143/225හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-229

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001413.

ණයකරුගේ සම්පූර්ණ නම : විල්පිට හේවා ගමගේ අරුණ ශාන්ත.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. රුහුණුහේවා විසින් ලියා සහතික කරන ලද අංක 2447 හා 2004.05.14 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හාරදහස් පන්සිය පනස්එකයි ශත හතලිස් දෙකක (රු. 3,04,551.42) ක මුදලක් වර්ෂ 2005.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ පනස් අටදහස් එකසිය අසූහයයි ශත තිස්තුනක (රු. 2,58,186.33) මුදල ද වර්ෂ 2005.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් හයදහස් තුන්සිය හැට පහයි ශත නවයක් (රු. 46,365.09) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ හාරදහස් පන්සිය පනස්එකයි ශත හතලිස් දෙකක (රු. 3,04,551.42) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ පනස් අටදහස් එකසිය අසූහයයි ශත තිස්තුනක (රු. 2,58,186.33) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12.5% බැගින් වන පොළියක් 2006.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ක් වූ පෙබරවාරි මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහ පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුළ කටාන ප්‍රාදේශීය සභා සීමාවේ උතුරු කදිරාන ග්‍රාමයෙහි පිහිටි වෙස්ටර් සීටන් ෆාම් නමැති ඉඩමට 2001.04.29 දින ඩබ්. එස්. එස්. මෙන්ඩිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 2172/බී පිඹුර ප්‍රකාර ලොට් 6ට මායිම්, උතුරට : කැබලි අංක 05 ද, නැගෙනහිරට : පාර (පිඹුරු අංක 2684 හි ලොට් 13) ද, දකුණට : කැබලි අංක 7 ද, බස්නාහිරට : ජී. ජේ. ප්‍රනාන්දු සහ අනෙක් අයට අයිති එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 12.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 908/51හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-230

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400000989.

ණයකරුගේ සම්පූර්ණ නම : සිරිවර්ධන දිසානායකගේ සෙනෙවිරත්න.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 2937 හා 2002.12.19 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූඅටදහස් හයසිය පනස් දෙකයි ශත අසූඅටක (රු. 1,98,652.88) ක මුදලක් වර්ෂ 2005.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය අනූහතයි ශත හැත්තෑ නවයක (රු. 1,70,397.79) ද වර්ෂ 2005.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිඅටදහස් දෙසීය පනස්පහයි ශත නවයක් (රු. 28,255.09) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අනූඅටදහස් හයසිය පනස් දෙකයි ශත අසූඅටක (රු. 1,98,652.88) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑ දහස් තුන්සිය අනූහතයි ශත හැත්තෑ නවයක (රු. 1,70,397.79) මුදල මත අයවිය යුතු වර්ෂයකට 10.50% බැගින් වන පොළියක් 2006.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ක් වූ පෙබරවාරි මස 23 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, දියපොතගම්පත්තුව, සූළු කොට්ඨාසයේ, ඇඹිලිපිටිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ ඇඹිලිපිටිය උඩුගම ග්‍රාමයෙහි දෙවන පටුමගේ, වරිපනම් අංක 31හි පිහිටි මෝදරවනේහේන්යාය නැමැති ඉඩමට 1994.06.27 දින මිණුම්පති විසින් මැන සම්පාදිත අංක F. V. P. 778 පිඹුර ප්‍රකාර ලොට් 6421ට මායිම්, උතුරට : ලොට් 6456 (පාර) ද, නැගෙනහිරට : ලොට් 6424 ද, දකුණට : ලොට් 6423 ද, බස්නාහිරට : ලොට් 6420 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 24.5) *හෙවත්* (0.062 හෙක්ටයාර්) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G100/222 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-226

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0100007133.

ණයකරුගේ සම්පූර්ණ නම : වීරතුංග ආරච්චිගේ දිස්නා මල්කාන්ති සහ අතපත්තු හේවාවසම් ලියනගේ ගාමිණී ජයසිරි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩී. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 2739 හා 2005.04.28 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හතලිස්හයදහස් හත්සිය දාහතරයි ශත හයක (රු. 5,46,714.06) ක මුදලක් වර්ෂ 2006.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූහයදහස් නමසිය හැටහයයි ශත හතලිස් දෙකක (රු. 4,96,966.42) ද වර්ෂ 2006.05.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් නමදහස් හත්සිය හතලිස් හතයි ශත හැටහතරක (රු. 49,747.64) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ හතලිස්හයදහස් හත්සිය දාහතරයි ශත හයක (රු. 5,46,714.06) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ අනූහයදහස් නමසිය හැටහයයි ශත හතලිස් දෙකක (රු. 4,96,966.42) මුදල මත අයවිය යුතු වර්ෂයකට 12% බැගින් වන පොළියක් 2006.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ක් වූ ජූලි මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, කොරතොට ග්‍රාමයෙහි ගලබොඩවත්ත නැමැති ඉඩමට 1997.10.13 දින එස්. රාමක්‍රිෂ්නන් මානක තැන විසින් මැන සම්පාදිත අංක 6451 පිඹුර ප්‍රකාර ලොට් බී ට මායිම්, උතුරට : අඩි 10 පළල පාර ද, නැගෙනහිරට : එම්. ඩී. එම්. එච්. ජයවර්ධන මාවත ද, දකුණට : ආර්. ඒ. පියදාසට සහ අනෙක් අයට අයත් ඉඩම ද, බස්නාහිරට : ලොට් ඒ ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1540/151හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-227

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 02/3/00/01023.

ණයකරුගේ සම්පූර්ණ නම : රාජපක්ෂ පිරිස්යාල අප්පුහාමිලාගේ ශ්‍රියානි නදීරා රාජපක්ෂ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. එස්. කේ. ජයසේකර විසින් ලියා සහතික කරන ලද අංක 631 හා 2001.01.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑ හයදහස් හත්සිය අසූහයයි ශත දහහත (රු. 1,76,786.17) ක මුදලක් වර්ෂ 2003.05.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් හාරසිය විසිතුනයි ශත දෙක (රු. 1,46,423.02) මුදල ද වර්ෂ 2003.05.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්දහස් තුන්සිය හැටතුනයි ශත පහළොව (රු. 30,363.15) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑ හයදහස් හත්සිය අසූහයයි ශත දහහත (රු. 1,76,786.17) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් හාරසිය විසිතුනයි ශත දෙක (රු. 1,46,423.02) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොළියක් 2003.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, කළුඅග්ගල ග්‍රාමයෙහි පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට 2000.01.20 දින ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 574 ප්‍රකාර ලොට් 01 සහ 02ට මායිම්, උතුරට : ආර්. පී. හරිචන්ද්‍රට අයිති ඉඩම හා ලොට් 08 (පාර) ද, නැගෙනහිරට : ලොට් 08 හා 03 ද, දකුණට : 4489 පිඹුරේ ලොට් 02 ද, බස්නාහිරට : ජේ. පී. ඒ. පබ්ලිස් අප්පුහාමිට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 36.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පාර්ශවතාවය ද සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 271/267හි ලියාපදිංචි කර ඇත.

2003ක් වූ මැයි මස 31 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-228

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-කොටහේන ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 ජූනි මස 29 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඹලුව විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ලියා සහතික කරන ලද්දා වූ 2005.01.19 දින සහ අංක 1164 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේයරත්නම් වික්නේෂ්වරන් ණයකරු සහ උකස්කරු ලෙස සහ වනිතා වික්නේෂ්වරන් උකස්කරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහහතරලක්ෂ අනූපන්දහස් එකසිය දහසයයි ශත හැත්තෑතුනක (රු. 14,95,116.73) ක මුදලක් 2006.12.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 14,95,116.73 මුදලට 2007.01.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1164 දරන බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තර කර ඇත්තා වූ දේපළ සහ පරිශ්‍රය කොළඹ වෙන්දේසිකරු එන්. එච්. ජී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත දෙලගොඩ උප කාර්යාල තුළ බොල්ලෑගල සහ පට්ටිවිල පිහිටා ඇති මානෙල් වත්ත පාරේ, වරිපනම් අංක 25/99 දරන ස්ථානයේ කොස්ගහලන්ද සහ ගොරකගහවත්ත (කොටස් 3කින් ද) අලුබෝගහවත්ත, ගොරකගහවත්ත, කොස්ගහලන්ද, මිල්ලගහවත්ත, මිල්ලගහකනත්තේවත්ත, ගොරකගහවත්ත, අලුබෝගහවත්ත සහ මිල්ලගහවත්ත, කොස්ගහවත්ත සහ මහරගහවත්ත, මිල්ලගහවත්ත, මොරගහහේන සහ මිල්ලගහවත්ත නමින් හැඳින්වෙන ඉඩමට බලයලත් මානක ආර්. යූ විජේතුංග විසින් පිළියෙල කරන ලද 2003 නොවැම්බර් මස 18 දිනැති සහ අංක 3313/2003 දරන පිඹුරේ ලොට් අංක 5 වශයෙන් මැන බෙදා වෙන් කොට සලකුණු කර ඇති ඉඩම, උතුරින් : ජයම්පති ගුණසේකරට අයත් ඉඩමින් ද, නැගෙනහිරට : ජයම්පති ගුණසේකරට අයත් ඉඩමින් සහ අංක 8450 දරන පිඹුරේ ලොට් අංක 8න් ද, දකුණට : අංක 8450 දරන පිඹුරේ ලොට් අංක 6 සහ 7න් ද, බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහනවයයි දශම අටයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 19.80) විශාලැති ඉඩම එහි ඇති ගොඩනැගිලි සහ සියළු දේත් සමඟ වේ.

බලයලත් මානක වී. එෆ්. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 8450 දරන පිඹුරෙහි ලොට් 4න් වෙන්කර ඇති මීටර් 4.5ක් පළල මතින් දිවෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
සමාගමේ ලේකම්.

09-223/6

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මහරගම ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007ක් වූ ජූලි මස 31 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට ලියා සහතික කරන ලද්දා වූ 2005.02.18 දින සහ අංක 1374 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දේවමුල්ලගේ තිලක් පුෂ්පකුමාර ඩයස් ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ දහහත්දහස් දෙසීය අනූඅටයි ශත අසූදෙක (රු. 3,17,298.82) ක මුදලක් 2005.09.30 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 3,17,298.82 මුදලට 2005.10.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1374 දරන බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තර කර ඇත්තා වූ දේපළ සහ පරිශ්‍රය කොළඹ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභාවේ, නිරිපිටියේ පිහිටි "ගලකඩවත්ත හෙවත් දෙල්ගහවත්ත" නමින් හඳුන්වන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමට බලයලත් මානක එන්. පී. ඇල්විටිගල විසින් මැන සාදන ලද 2005.01.27 දිනැති අංක 2457 දරන පිඹුරේ ලොට් 01 ලෙස සලකුණු කරන ලද නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම, උතුරට : අංක 704 දරන පිඹුරේ ලොට් 13 සහ අංක 1031 දරන පිඹුරේ ලොට් අංක පී වලින් ද, නැගෙනහිරට : අංක 1031 දරන පිඹුරේ ලොට් අංක ජී වලින් සහ අංක 704 දරන පිඹුරේ ලොට් 15න් ද, දකුණට : අංක 704 දරන පිඹුරේ ලොට් 15න් සහ පාරෙන් ද, බස්නාහිරට : අංක 704 දරන පිඹුරේ ලොට් 13න් සහ පාරෙන් ද මායිම් වූ එකී අංක 2457 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහනමයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 19.50)ක් විශාල ඇති ඉඩම වේ.

ඉන්ද්‍රාණි ගුණසේකර,
